**WARNALEGAL**
*Justice for all*

www.warnalegal.com




- FAMILY LAW
- MIGRATION LAW
- CONVEYANCING
- LITIGATION
- AUSTRALIAN LEGAL ADVICE
- SRI LANKAN LEGAL ADVICE
- COMMERCIAL & BUSINESS LAW
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS & COMPANY REGISTRATION SERVICE

GUSS DESIGN 03 9769 0099



**Madhu Warnakulasuriya** *LL.B*
*Solicitor and Barrister*
*Registered Migration Agent*
*(MARN 1068979)*
*Attorney at Law in Sri Lanka*



Need Legal Help? Call us Now
**03 9792 9977**

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2




## ගුරුවරු

සෙන් ආචාර්යවරයකු හමුවන්න ආ ශිෂ්‍යයකු මෙසේ කීවා.

"ඔබ දක්ෂ සටන් ආචාර්යවරයෙක් කියලා මං අහලා තියෙනවා. මං කැමතියි ඔබේ මුලු ශිල්පයම ඉගෙනගන්න ආචාර්යතුමනි. ඔබෙන් ඉගෙන ගන්නා අතරම මම කැමතියි අර එහා නගරයේ ඉන්න සටන් ආචාර්යවරයාගෙනුත් ඔහුගේ සටන් ශිල්පය ඉගෙන ගන්න. මොකද එහෙම ඉගෙන ගත්තම මට සටන් ශිල්ප ක්‍රම දෙකකම දක්ෂයෙක් වෙන්න පුලුවන්."

ආචාර්යවරයා තරුණයා දෙස සැළකිල්ලෙන් බැලුවා. බලලා මෙහෙ කිව්වා.

"හාවන් දෙදෙනකු පසුපස එළවා යන දඩයක්කාරයාට එක හාවෙක්වත් අල්ලගන්න ලැබෙන්නෙ නෑ"

**හැම දෙයක්ම එකවර බදාගන්න යන්නාට අවසානයේ සිදුවන්නේ සියල්ල අහිමි කර ගැනීමයි කියන එක මේ කතාවෙන් කියවෙනවා කියලා හිතන්න පුලුවන්. තවත් අතකින් හැම දෙයක්ම පසුපස නොදුවා තමන් ඉගෙන ගන්නා දෙයට සියයට සියයක් ම අවධානය යොදනා ශිෂ්‍යයා ජයගන්නවා කියලත් කියන්න පුලුවන්.**

## අධිෂ්ඨානය

ජනරාල්වරයකු තමන්ගෙ හමුදාව සමගින් යුද්ධයකට යමින් හිටියා. අනික් පාර්ශවයේ හමුදාව එක්ක බලනකොට ඔහුගෙ හමුදාවෙ හිටියෙ ඉතා අඩු සොල්දාදුවන් සංඛ්‍යාවක්. මේක දැනගත්ත සොල්දාදුවන් ඉතාම අධෛර්යයට පත්වුණා.

යුද පිටියට යන අතරේ ජනරාල්වරයා හමුදාව පන්සලකට එක් ගියා. පන්සලේ පුද පූජා කිරීමෙන් පසුව ජනරාල් වරයා හමුදාව ඇමතුවා.

"මේ බලන්න. . හැමදේම සිදුවෙන්නෙ දෛවය අනුවයි. අපට ඒක වෙනස් කරන්න බැහැ. " ඔහු සාක්කුවෙන් කාසියක් ඉවතට ගත්තා. "මම දැන් මේ කාසිය උඩ දානවා. කාසියේ හිස පැත්ත වැටුණොත් අපි යුද්ධය දිනනවා.. අනික් පැත්ත වැටුණොත් අපි පරදිනවා"



ජනරාල්වරයා කාසිය උඩ දැම්මා. කාසිය පෙරළිලා ගිහින් හිස පැත්ත උඩට හිටින ලෙස නැවතුණා. මුලු හමුදාවට ජය ඝෝෂා නැගුවා. ඔවුන් යුද්ධයට ගිහින් ජයගත්තා.

යුද්ධය ජයඅරන් ආපසු එන අතරේ හමුදාවේ දෙවෙනියා නායකයා ළග'ට ආවා.

"ජනරාල්තුමනි. දෛවය වෙනස් කරන්න බැහැ කියලා ඔබ කිව්ව කතාව ඇත්තක් බවට පත්වුණා නේද?" ඔහු ඇහුවා.

"සහතික ඇත්ත. ." ජනරාල් වරයා සාක්කුවට අත දාන ගමන් කිව්වා. ඔහු සාක්කුවෙන් ගත් කාසිය දෙවෙනියා අතේ තිබ්බා. කාසියේ දෙපැත්තෙම තිබුණෙ හිස සළකුණ.

**ඔබ ඔබ කෙරෙහි විශ්වාසය තබන්නේ නම් ජයග්‍රහණය ඔබටයි.**

ජගත්